ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

BOC හරිත කැකුළු SMART				
නිමැවුමේ ස්වභාවය	**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**	**ආරම්භක තැන්පතු හා ගාස්තු**	**සුදුසුකම්**	**ප්‍රධාන නියම හා කොන්දේසි**
වයස අවු. 6-18 අතර වයස් කාණ්ඩයේ පසුවන ශ්‍රී ලංකාවේ නේවාසික ළමුන් සඳහා වෙන්වූ ඉතුරුම් ගිණුම	• පොලී අනුපාතය සාමාන්‍ය ඉතුරුම් පොලී අනුපාතයට වඩා 1.5%ක් වැඩිය. (රන් කැකුළු Smart ගිණුමට සමාන වේ.) නවතම පොලිය බලාගැනීමට https://www.boc.lk/rates-tariff#rupee-deposit-rates වෙත පිවිසෙන්න. නවතම පොලී අනුපාතය බලාගැනීමට www.boc.LK(rates) වෙත පිවිසෙන්න. • ගිණුම්හිමියා සඳහා වෛද්‍ය රක්ෂණාවරණය • ගිණුම ආරම්භ කරන මව,පියා/භාරකරු සඳහා ජීවිත රක්ෂණාවරණය • 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළම ලකුණු ලබාගන්නා සමතුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය • ගිණුම් ශේෂයන් හා ගනුදෙනු පිරික්සීම සඳහා E-ප්‍රකාශ/ Smart පාස්පොත් පහසුකම • නොමිලේ SMS alert පහසුකම • තිරසර සංකල්පයට අනුගත්ව පාස්පොත් නිකුත්කරනු නොලැබේ. ඒ වෙනුවට ගිණුම් විස්තර දැක්වෙන සන්නාමිත ප්‍රතිචක්‍රීකරණය කළ කාඩ්පතක් නිකුත් කෙරේ. • සේවා ගාස්තු අදාළ නොවේ.	• අවම ආරම්භක තැන්පතුව රු. **250/-**ක් වේ. • **ගිණුම වසාදැමීමේ ගාස්තු - රු.500/-** • **ගිණුම් ශේෂය මත මාසික සේවා ගාස්තු අදාළ නොවේ.** • **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.	• වයස අවු. 6-18 අතර වයස් කාණ්ඩයේ පසුවන ශ්‍රී ලංකාවේ නේවාසික ඕනෑම ළමයකු වෙනුවෙන් මෙම ගිණුම විවෘතකළ හැකිය. • තනි පුද්ගල ගිණුම් පමණක් විවෘත කළ හැකිය. • මව, පියා/ භාරකරු විසින් ළමයාගේ නමින් ගිණුම විවෘත කළ හැකිය. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** - ළමයාගේ උප්පැන්න සහතිකය (මැන්ඩේට්පතේ හා උප්පැන්න සහතිකයේ විස්තර නිවැරදි දැයි බලන්න) සහ ජාතික හැඳුනුම්පත (තිබේනම්) එහි අංකය - ගිණුම විවෘතකරන මව, පියා/ භාරකරුගේ ජාතික හැඳුනුම්පත (මැන්ඩේට්පතේ හා ජා.හැ.පතේ විස්තර නිවැරදි දැයි බලන්න) - ලිපිනය තහවුරුකිරීමේ ලේඛනයේ පිටපත (මැන්ඩේට් පත්‍රයේ දී ඇති ලිපිනය හා උප්පැන්න සහතිකයේ/ජා.හැ.පතේ ලිපිනය වෙනස් වේ නම්) - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග, BOC රන් කැකුළු Smart ගිණුමක් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	• ගිණුම්හිමියාට වයස අවු. 18 වනවිට මෙම ගිණුම් කාණ්ඩවලට අදාළ සුදුසුකම් නිර්ණායක සම්පූර්ණකිරීමට ගිණුම්හිමියාට ඇති හැකියාව මත මෙම ගිණුම යොවුන් ඉතුරුම් ගිණුමකට මාරුකරනු ලැබේ. • බාලවයස්කරුට වයස අවු. 18 වනතෙක් මුදල් ආපසුලබා ගැනීමකට/ ගිණුම වසාදැමීමට අවසර නොලැබේ. ගිණුමෙන් මුදල් ආපසුලබා ගැනීමකට/ ගිණුම වසාදැමීමට ඉඩලැබෙනුයේ හුදෙක් බැංකුවේ අභිමතය මත හෝ අධ්‍යාපනය, වෛද්‍ය ප්‍රතිකාර වැනි බාලවයස්කරුට ප්‍රතිලාභ ගෙනදෙන හේතු නිසා පමණි. • ගිණුමෙන් ලබාදෙන විශේෂ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා (උදා: රක්ෂණය, ත්‍යාග, ශිෂ්‍යත්ව වැනි) ගිණුම්හිමියා විසින් ගිණුම් ශේෂය/තැන්පතුව, වයස් සීමාව වැනි කලින් කලට බැංකුව විසින් තීරණය කරනු ලබන නියමිත නිර්ණායක සපුරාලිය යුතුවේ.

Classification: Internal

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.

අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිඳු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.
- දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 ෆැක්ස්: +94 11 243 5815 විද්‍යුත් ලිපිනය: bocexmgt@boc.lk වෙබ් අඩවිය: https://www.boc.lk
- තැපෑල: ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.